සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2025
Year End Evaluation - 2025

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි
- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I පත්‍රය

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11745

01. සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු වඩා වැදගත් කාර්යය කුමක් ද?
   (1) ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම.
   (2) නායකත්වයට හුරු කිරීම.
   (3) යහපත් සමාජානුයෝජනයක් ඇති කිරීම.
   (4) පරිසරය සුරැකීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

02. බැංකු කටයුතු සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතා කිරීම නිසා ලැබී ඇති වාසියක් වන්නේ,
   (1) හොර නෝට්ටු භාවිත කළ හැකි ය.
   (2) මුදල්වලට අමතර ආරක්ෂාවක් ලැබීම.
   (3) දිවාකාලයට පමණක් භාවිත කිරීමට හැකියාව ලැබීම ය.
   (4) අමතර වියදමක් දැරීමට සිදු වේ.

03. "ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි."
   ඉහත ප්‍රකාශය කරන ලද්දේ,
   (1) ඒබ්‍රහම් ලින්කන් විසිනි. (2) රොබට් ඕවන් විසිනි.
   (3) සීලර් විසිනි. (4) මහත්මා ගාන්ධි විසිනි.

04. මහ නගර සභාවක ප්‍රධානියා හැටියට කටයුතු කරන්නේ,
   (1) ලේකම් ය. (2) නාගරික කොමසාරිස් ය.
   (3) සභාපති ය. (4) නගරාධිපති/පුරපති ය.

05. ගැටුම් නිරාකරණය සඳහා යොදාගත හැකි සරලම ක්‍රමය කුමක් ද?
   (1) මැදහත්කරණය (2) සාකච්ඡා ක්‍රමය (3) සමථකරණය (4) විනිසීම



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. කාර්මික විද්‍යාල වර්තමානයේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) ලබාදෙන ආයතනයකි. ( )
07. "රට වට බැඳි රන් වැට" ශ්‍රී ලංකා යුධ හමුදාවේ ආදර්ශ පාඨය වේ. ( )
08. තම කටයුතු වඩා පහසුකර ගැනීම සඳහා මිනිසා යොදාගන්නා ක්‍රමවේදය තාක්ෂණය යි. ( )
09. උතුරු කොරියාව ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකි. ( )
10. මහනුවර දිස්ත්‍රික්කය වැඩිම පළාත් පාලන ආයතන සංඛ්‍යාවක් පිහිටි දිස්ත්‍රික්කය වේ. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු නිවැරදි පිළිතුර සහිත වචනය වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න.**

**(අන්තර්ජාලය, නිරාකරණය, ආයතනයේ, දෙපාර්තමේන්තුවේ, සහයෝගයෙන්, ඡන්දය)**

11. විනිසීම යනු ගැටුම් ...................................... සඳහා යොදාගන්නා අධිකරණ ක්‍රියාවලියකි.
12. වර්තමානයේ රැකියා දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ...................................... යොදාගනු ලැබේ.
13. නීතිපතිවරයා, නීතිපති ...................................... ප්‍රධානියා හැටියට සැළකේ.
14. ...................................... කටයුතු කිරීම සහජීවන ගුණාංගයකි.
15. තමන් කැමති පාලකයෙකු හෝ නියෝජිතයෙකු තෝරා ගැනීම ...................................... ලෙස හැඳින් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා X කොටසේ ප්‍රකාශයට ගැළපෙන නිවැරදි ප්‍රකාශය Y කොටසින් තෝරා අදාල අක්ෂරය වරහන තුළ ලියන්න.**

| | X කොටස | | | Y කොටස |
|---|---|---|---|---|
| 16. | වයස අවුරුදු 21 ට වැඩි සැමට සර්වජන ඡන්ද බලය හිමි වූයේ | ( ) | A | සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙනි. |
| 17. | රැකියාවක් ලබා ගැනීමේ දී ශාස්ත්‍රීය සුදුසුකම් සමග | ( ) | B | සමූපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය වේ. |
| 18. | ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල ආරම්භය සිදුවූයේ | ( ) | C | ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙනි. |
| 19. | රාජ්‍ය පාලනය සම්බන්ධ මූලික සිද්ධාන්ත ඇතුළත් උත්තරීතර නීතිය | ( ) | D | වෘත්තීය සුදුසුකම් ද අවශ්‍ය වේ. |
| 20. | "එකා සැමටත් සැම එකාටත්" | ( ) | E | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි. |
| | | ( ) | F | බ්‍රිතාන්‍ය පාලන යුගයේ සිටය. |

(ල. 2 × 20 = ල. 40 යි)


For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

# පුරවැසි අධ්‍යාපනය - 9 ශ්‍රේණිය

## II පත්‍රය

සැලකිය යුතුයි
- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. (i) සමාජ සුරක්ෂිතතාවයට දායකවන ආයතන දෙකක් නම් කරන්න. (ල. 2)
(ii) යුක්තිය පසිදලීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන දෙකක් සඳහන් කරන්න. (ල. 2)
(iii) ඒක දේශික ශාක දෙකක් නම් කරන්න. (ල. 2)
(iv) බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)
(v) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත්පාලන ආයතන දෙකක් ලියා දක්වන්න. (ල. 2)
(vi) ලෝකයේ දක්නට ලැබෙන ගැටුම් වර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 2)
(vii) වානිජ විෂය ධාරාව ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකුට රැකියා වෙළඳ පොළෙහි පවතින වෘත්තීන් දෙකක් නම් කරන්න. (ල. 2)
(viii) නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 2)
(ල. 2 × 8 = 16)

02. (i) නීතිය ක්‍රියාත්මකවන ආකාරය අනුව බෙදා ඇති කොටස් දෙක නම් කරන්න. (ල. 2)
(ii) අපරාධ නීතිය යටතට අයත්වන වැරදි හතරක් සඳහන් කරන්න. (ල. 4)
(iii) ශ්‍රී ලංකා පොලිසියෙන් ජනතාවට සිදුවන සේවාවන් දෙකක් නම් කර, ඉන් එකක් විස්තර කරන්න. (ල. 5)

03. (i) තාක්ෂණය යොදාගන්නා අවස්ථා දෙකක් නම් කරන්න. (ල. 2)
(ii) වර්තමානයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දියුණුවට තාක්ෂණය යොදාගන්නා අවස්ථා හතරක් සඳහන් කරන්න. (ල. 4)
(iii) තාක්ෂණ වෙනස්වීම් නිසා ඇතිවී ඇති අහිතකර බලපෑම් පහක් ලියා දක්වන්න. (ල. 5)

04. (i) "ප්‍රජාතන්ත්‍රවාදය" පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇති පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න. (ල. 2)
(ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් හතරක් ලියා දක්වන්න. (ල. 4)
(iii) පුරවැසියකු සතු අයිතිවාසිකම් පහක් සඳහන් කරන්න. (ල. 5)

05. (i) පළාත් පාලන ආයතනයකින් ඉටුවන මහජන සේවා දෙකක් නම් කරන්න. (ල. 2)
(ii) පළාත් පාලන ආයතන වර්ග හතරක් සඳහන් කරන්න. (ල. 4)
(iii) පළාත් පාලන ආයතනයක සේවා ලාභීන් ඉටුකළ යුතු යුතුකම් තුනක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)



For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

06. (i) ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii) ගැටුම් ඇතිවීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න. (ල. 4)

(iii) ගැටුම් සුබවාදීව විසඳා ගැනීමේ වාසි තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 5)

07. (i) වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) ජීව දත්ත පත්‍රිකාවක අඩංගු අංග හතරක් සඳහන් කරන්න. (ල. 4)

(iii) කාල කළමණාකරණයේ දී පුද්ගලයකුගේ කාලය බෙදාගත හැකි කොටස් තුන නම් කර ඉන් එක් කොටසක් ඵලදායි ලෙස ගත කරන අයුරු විස්තර කරන්න. (ල. 5)



For Educational Purpose Only

SLGURU.LK